# පොතුවැපිටිය එල්ලංගා පැතිකඩ සහ මූලික සංවර්ධන සැලැස්ම



**කෘෂිකර්ම අමාත්‍යාංශය**

**දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය**

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය – වයඹ පළාත**

# පටුන


| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම | 7 |
| 1.1 | පොතුවැපිටිය එල්ලංගාව හා එහි පිහිටීම | 8 |
| 1.2 | පොතුවැපිටිය එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා | 13 |
| 1.3. | නෙලිවව එල්ලංගාව හා සාමාන්‍ය තොරතුරු | 14 |
| 1.4 | නෙලිවව එල්ළංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත් කම | 18 |
| 1.5 | එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම | 19 |
| 1.6 | නෙලිවව එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය | 21 |
| 1.7 | නෙලිවව එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ අවශ්‍යතාවය | 22 |
| 1.8 | එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කල ක්‍රමවේදය | 23 |
| 1.9 | එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු | 24 |
| 1.10 | එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම | 25 |
| 2 | එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීම දී අනුගමනය කල ක්‍රමවේදය | 25 |
| 3. | පොතුවැපිටිය එල්ලංගාවේ වර්තමාන පැතිකඩ | 27 |
| 3.1 | භූගෝලීය (**Geographical** )තොරතුරු | 27 |
| 3.2 | භූ විද්‍යාත්මක (**Geological**) තොරතුරු | 27 |
| 3.3 | ජල විද්‍යාත්මක (**Hydrological**)තොරතුරු | 29 |
| 3.4 | පරිසර විද්‍යාත්මක(**Environmental**) තොරතුරු | 33 |
| 3.5 | එල්ලංගාව තුල මානව ජීවනෝපාය ක්‍රියාකාරකම | 35 |
| 3.6 | එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු | 39 |
| 3.7 | එල්ලංගාවේ පවතින ඉදිකිරීම් | 40 |
| 3.8 | එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව | 41 |
| 3.9 | එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය | 41 |
| 4 | පොතුවැපිටිය එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හඳුනා ගැනීම | 42 |
| 4.1 | උග්‍ර ගැටළුවිසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් | 44 |

4.2 එල්ලංගා කලමණාකරන කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිත උග්‍ර ගැටළු විසඳා ගැනීම හෝ අවම කිරීම සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාත්මක සැලැස්ම හා දළ ඇස්තමේන්තුව 47


ඇමුණුම් 01 49

ඇමුණුම් 02 54

## 1. හැඳින්වීම

ප්‍රාථමික ජල මාර්ගයක හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති ජල විද්‍යාත්මක ලෙස එකට බැඳුනු කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් පද්ධති හෝ කුඩා වැව්, මධ්‍ය ප්‍රමාණයේ වැව් සහ අමුණු පද්ධති, වලින් සමන්විත වූ ද්විතිය හා තෘතිය ජල මාර්ගයකට ජලය මුදා හරිනු ලබන මධ්‍ය ජල ධාරා ප්‍රදේශය එල්ලංගාව ලෙස හඳුන්වනු ලබයි. එල්ලංගාව අපගේ වාරි ශිෂ්ඨාචාරයේ විශිෂ්ඨ නිර්මාණයකි. එමගින් මුලු පරිසර පද්ධතියේම තිරසර පැවැත්ම තහවුරු කරයි.


වාරි ශිෂ්ඨාචාරයේ මෙම මාහැඟි අමිල නිර්මාණයක් වන එල්ලංගාව සංරක්ෂණය කර මනා කලමණාකරනයක් තුලින් "දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ" සංවර්ධන කටයුතු තිරසර ලෙස පවත්වා ගෙන යාම සඳහා එල්ලංගා කලමණාකරනය පහසු කිරීමට ව්‍යාපෘති ප්‍රතිලාභීන්ගෙන් සහ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන වලින් සමන්විත එල්ලංගා කලමණාකරන කමිටු පිහිටු වීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය කටයුතු කරනු ලබයි. එල්ලංගාවේ සියලු පාර්ශව එකතු වී සියලු සම්පත් මනාව කලමණාකරනය කිරීම එල්ලංගා කලමණාකරන කමිටුවල මූලික වගකීම වන අතර එම කාර්යය පහසු කිරීම සඳහා අවශ්‍ය සැලසුමක් සැකසීමට අවශ්‍ය තොරතුරු එකතු කිරීම සඳහා එල්ලංගා පැතිකඩක්පළාතේ සෑම එල්ලංගාවක් සඳහාම සකස් කරනු ලබයි. එල්ලංගා කලමණාකරන කමිටුව හරහා එල්ලංගාව හා ජලධාරා ප්‍රදේශය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන සැලැස්ම සකස් කර ඇත.එල්ලංගා පැතිකඩක් සැකසීමේ ප්‍රධාන අපේක්ෂාව වන්නේ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමයි.




රූපසටහන 01- පැරණි එල්ලංගාවක පිහිටීම

මෙවැනි එල්ලංගා පද්ධතියක් නිසි ආකාරව පවත්වා ගැනීමටත් නිසි කළමනාකරණයකින් යුක්තව එල්ලංගාවේ ජලය බෙදා හැරීමටත් සුදුසු වන පරිදි අතීතයේ සිටම වාරි පද්ධතිය නිර්මාණය කර ඇත. ඒ අනුව එල්ලංගාවේ ප්‍රධානතම අංගයක් වන වැවක අනිවාර්යයෙන්ම පැවතිය යුතු අංග කිහිපයක් පවතී. මෙම අංග නිසි ආකාරව ඉදි කිරීම හා නිසි ආකාරව නඩත්තු කිරීම එල්ලංගාවේ මනා ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපායි. ඒ අනුව එල්ලංගා පද්ධති කළමනාකරනයේ දී වැවක පැවතිය යුතු පහත කොටස් පිළිබඳව

අබෝධයක් ලබා ගැනීම ඉතා වැදගත් වේ. සාම්ප්‍රදායික වාරි පරිසර පද්ධතියක ප්‍රධාන අංගයක් ලෙස වැව හඳුනාගත හැක. ඒ අනුව වැවක පැවතිය යුතු ප්‍රධාන අංග ලෙස සොරොව්ව, වැව් බැම්ම, වාන, වාන් ඇළ,



රළපනාව, ඇළවේලි, කට්ටකඩුව, ගොඩවල, පෙරහන, කුණු ඇළ ආදී කොටස් හඳුනා ගතහැක. වැවක අනිවාර්යයෙන් පැවතිය යුතු මෙම අංග සම්බන්ධව ඇතිවන ගැටළු වැව ආශ්‍රිතව සිදුකරන කෘෂිකාර්මික, ධීවර ආදි නිෂ්පාදන කෙරෙහිද අනෙකුත් මානව හා පාරිසරික ක්‍රියාකාරකම් කෙරෙහි ද සෘණාත්මකව බලපානු ලබයි.

රූපසටහන - පැරණි වැවක පවතින ප්‍රධාන කොටස්

## 1.1. පොතුවැපිටිය එල්ලංගාව හා එහි පිහිටීම

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශෙයේ රඹේ ගොවිජන සේවා බල ප්‍රදේශයේ 358 නියදවනය ග්‍රාම නිලධාරී වසමේ තුල පොතුවැපිටිය එල්ලංගා පද්ධතිය පිහිටා ඇත. මී ඔය ද්‍රොණියේ තුන්වන උපද්‍රොනියේ පිහිටා ඇති මෙම එල්ලංගාව අයත් පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල එල්ලංගා පද්ධති 11ක් හා වැව් අමුණු 488 පිහිටා ඇත. ප්‍රදේශය තුල වැව් හා අමුණු වල පැතිරිම අක්කර 87554 වේ. එමගින් කුඹුරු අක්කර 24893ක්ද වේ. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ දෙවන අධියර යටතේ පොතුවැපිටිය එල්ලංගාව ප්‍රතිසංස්කරණය කිරිමට පියවර ගෙන ඇත. පොතුවැපිටිය එල්ලංගාව අවට පිහිටි අනෙකුත් එල්ලංගා ලෙස මකුල්ල ගහමුල්ල එල්ලංගාව (වැව් 04), පඩරුල් වැව එල්ලංගාව (වැව් 05) යන එල්ලංගා පිහිටා ඇත.


**- පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශෙය තුල පිහිටා ඇති එල්ලංගා පිලිබද තොරතුරු-**

| අනු අංකය | එල්ලංගාවේ නම | වැව් සංඛ්‍යාව | ප්‍රතිසංස්කරණය කරන/නොකරන බව |
|---|---|---|---|
| 01 | අමුණුකොලේ වැව | 12 | ප්‍රතිසංස්කරණය කිරීමට තෝරා ගෙන ඇත |
| 02. | ගලගාව වැව | 07 | ප්‍රතිසංස්කරණය කිරීමට තෝරා ගෙන ඇත |


| | | | |
|---|---|---|---|
| 03 | ගෙදර ගාව වැව | 11 | ප්‍රතිසංස්කරණය කිරීමට තෝරා ගෙන ඇත |
| 04 | කුරුඳු ගස් වැව | 08 | ප්‍රතිසංස්කරණය කිරීමට තෝරා ගෙන ඇත |
| 05 | මකුල්ල ගහ මුල වැව | 04 | ප්‍රතිසංස්කරණය කිරීමට තෝරා ගෙන ඇත |
| 06 | පඩරල් වැව | 05 | ප්‍රතිසංස්කරණය කිරීමට තෝරා ගෙන ඇත |
| 07 | පොන්නිලව වැව | 05 | ප්‍රතිසංස්කරණය කිරීමට තෝරා ගෙන ඇත |
| 08 | පොතුවැපිටිය වැව | 04 | ප්‍රතිසංස්කරණය කිරීමට තෝරා ගෙන ඇත |
| 09 | වැටිය වැව | 11 | ප්‍රතිසංස්කරණය කිරීමට තෝරා ගෙන ඇත |
| 10 | මුදියන්නේගම | 20 | ප්‍රතිසංස්කරණය කිරීමට තෝරා ගෙන ඇත |
| 11 | තලාද පිටිය | 22 | ප්‍රතිසංස්කරණය කිරීමට තෝරා ගෙන ඇත |

පොතුවැපිටිය එල්ලංගා පද්ධතියට වැව් 06 ක් ඇතුලත් වන අතර මෙම වැව් අතරින් වැව් 04 සුහුරු ව්‍යාපෘතියේ 11 වන අධියර යටතේ 2025 වර්ෂයේ සංවර්ධනය කිරිමට තෝරා ගෙන ඇත.

මෙම එල්ලංගා පද්ධතිය පිහිටි ග්‍රාම නිළධාරි වසම හෙක්ටයාර් 562.96ක පමණ භූමි භාගයක ව්‍යාප්ත වි ඇත . බල ප්‍රදේශයේ ඉඩම් අයිතියේ ස්වභාවය අනුව සින්නක්කර 42 බලපත්‍රලාභි 13 හා අනවසර පවුල් 42 ජිවත් වේ. තවද වැඩි ඉඩම් ප්‍රමාණයක් නියදවනය පුරාණ රජමහා විහාරයට අයත් පන්සල්ඉඩම් වන පාරම්පරික කුඹුරු ඉඩම් වේ. 1931 මිනින්දෝරු සිතියමට අනුව මෙරගොඩ, පොතුවැපිටිය හා නියදවනයයන ගම් 03ම එකට තිබූ බවත් ගොඩ මඩ ඇතුළුව අක්කර 1300 කට භූමි ප්‍රමාණයක් තිබූ බව ගැමියන් ගේ අදහසයි. පිහිටිම අනුව එල්ලංගාවේ පහල මුහුදු මට්ටමේ මිටර් 254 පමණ උසවන අතර එල්ලංගා පද්ධතියේ ඉහල මායිමේ උස මිටර් 340ක් පමණ වේ. හුදකලා කදු කිහිපයක් හැරුණු විට සම්පූර්ණ එල්ලංගා පද්ධතියම මිටර් 274කට අඩු උසකින් යුත් සාමාන්‍ය තැනිතලා භූමියකි. මුළු එල්ලංගා පද්ධතිය තුලම වනාන්තර අක්කර 19කි. එල්ලංගා පද්ධතිය තුල කුඹුරු අක්කර 127 ක් ද ග්‍රාම නිළධාරි වසම තුල සම්පූර්ණ පෝෂක කුඹුරු ප්‍රමාණය අක්කර 416ක් වේ. එල්ලංගා පද්ධතියට අයත් වැව් වල (ප්‍රතිසංස්කරණය කිරිමට තෝරා ගෙන ඇති) ජල පෝෂක ප්‍රදේශය ලෙස අක්කර 17ක් හදුනා ගෙන ඇත. පොතුවැපිටිය එල්ලංගාව සම්බන්ධයෙන් ද ජනප්‍රවාදයන් පවති. නියදවනය රජමහ විහාරය පළමු වලගම්බා රජ සමයට අයත් බවත් නියදවනය රජමහ විහාරයේ තේවාව එකල ගම් වැසියන් විසින් සිදුකල බවත් සදහන් වේ. ඊට හොදම සාක්ෂිය වන්නේ යාපහුව රාජධානිය ඒ ආසන්නයේම පිහිටා තිබිමයි.





**සිතියම්-** පොතුවැපිටිය එල්ලංගාවට අයත් වැව්වල පිහිටීම





**ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් පොතුවැපිටිය එල්ලංගාව**

| අංක | ග්‍රා නි කොට්ඨාශයේ නම හා අංකය | ව්‍යාප්තිය හෙක්. | ජනගහනය | | ප්‍රදේශය තුල ගොවි සංවිධාන |
|---|---|---|---|---|---|
| | | | ස්ත්‍රී | පුරුෂ | |
| 01 | 358, නියදවනය | 562.96 | 457 | 389 | 03 |

**කුරුණෑගල දිස්ත්‍රික්කය තුල පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පිහිටීම**




මූලාශ්‍රය - 2023 පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සම්පත් පැතිකඩ ඉහත සඳහන් සිතියමේ වර්ණවත් කර ඇති කොටස් අනුව 358 නියදවනය වසමට අයත් පොතුවැපිටිය එල්ලංගා පද්ධතියට ආසන්නව පිහිටා ඇති එල්ලංගා ලෙස 359 මිගස් වැව වසමට අයිති මකුල්ලගහමුල්ල එල්ලංගාවද 360 මල් අස්න වසමට අයිති පඩරුල්වැව එල්ලංගාවද, 361 හත්පොකුණ වසමට අයිති ගලගාව වැව එල්ලංගාව ඇතුළු එල්ලංගාව 03ක් පිහිටා ඇත. මේ තුලින් අතීත මුතුන් මිත්තන්ගේ කෘෂිකාර්මික ජීවන රටාව හා වැව් එල්ළංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු



## 1.2 පොතුවැපිටිය එල්ලංගාව ආශ්‍රිතව පිහිටා ඇති අනෙකුත් එල්ලංගා

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශෙයේ මී ඔය ද්‍රොණියේ තුන්වන උපද්‍රොණියේ පිහිටා ඇති මෙම එල්ලංගාව අයත් පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල එල්ලංගා පද්ධති 11ක් හා වැව් අමුණු 488 පිහිටා ඇත. ප්‍රදේශය තුල වැව් හා අමුණු වල පැතිරිම අක්කර 87554 ක පැතිරියයි. එමගින් කුඹුරු අක්කර 24893ක් ද ඉන් එල්ලංගා පද්ධති 11කම දේශගුණ සුහුරු ව්‍යාපෘතියේ 11 අධියර යටතේ ප්‍රතිසංස්කරණය කිරිමට පියවර ගෙන ඇති අතර පොතුවැපිටිය එල්ලංගාවද ඉන් එකකි. මෙම එල්ලංගාව අවට පිහිටි එල්ලංගා ලෙස මකුල්ල ගහමුල්ල එල්ලංගාව (වැව් 04), පඩරල් වැව එල්ලංගාව (වැව් 05) යන එල්ලංගා පිහිටා ඇත.

වගු අංක 01 - පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශෙය තුල පිහිටා ඇති එල්ලංගා පිලිබඳ තොරතුරු දක්වා ඇත .

| අනු අංකය | එල්ලංගාවේ නම | අයත්වන වැව් සංඛ්‍යාව | ප්‍රතිසංස්කරණයකරන/නොකරන බව |
|---|---|---|---|
| 01 | අමුණුකොලේ වැව | 12 | ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇත |
| 02. | ගලගාව වැව | 07 | ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇත |
| 03 | ගෙදර ගාව වැව | 11 | ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇත |
| 04 | කුරුඳු ගස් වැව | 08 | ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇත |
| 05 | මකුල්ල ගහ මුල වැව | 04 | ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇත |
| 06 | පඩරල් වැව | 05 | ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇත |
| 07 | පොන්නිලව වැව | 05 | ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇත |
| 08 | පොතුවැපිටිය වැව | 04 | ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇත |
| 09 | වැටිය වැව | 11 | ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇත |
| 10 | මුදියන්නේගම | 20 | ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇත |
| 11 | තලාද පිටිය | 22 | ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇත |

පොතුවැපිටිය එල්ලංගාව එල්ලංගා පද්ධතියට වැව් 4ක් ඇතුලත් වන අතර මෙම වැව් සුහුරු ව්‍යාපෘතිය මගින් 11 අදියර යටතේ පුනරුත්ථාපනය කිරීමට නියමිතය. මෙම එල්ලංගා පද්ධතිය පිහිටි භූමි ප්‍රමාණය හෙ 935.2 පමණ වේ. පිහිටිම අනුව එල්ලංගාවේ මුහුදු මට්ටමේ මිටර් 254 පමණ උසවන අතර එල්ලංගා පද්ධතියේ ඉහල මායිමේ උස මිටර් 340ක් පමණ වේ. හුදකලා කඳු කිහිපයක් හැරුණු විට සම්පූර්ණ එල්ලංගා පද්ධතියම මිටර් 274 කට අඩු උසකින් යුත් සාමාන්‍ය තැනිතලා භූමියකි. මුළු එල්ලංගා පද්ධතිය තුලම වනාන්තර අක්කර 19කි. එල්ලංගා පද්ධතිය තුල කුඹුරු අක්කර 198 ක් ද ග්‍රාම නිළධාරි වසම තුල සම්පූර්ණ පෝෂක කුඹුරු ප්‍රමාණය අක්කර 416 ක් වේ. එල්ලංගා පද්ධතියට අයත් වැව් වල (ප්‍රතිසංස්කරණය කිරිමට තෝරාගෙන ඇති) ජල පෝෂක ප්‍රදේශය ලෙස අක්කර 17ක් හඳුනා ගෙන ඇත.

## 1.3 පොතුවැපිටිය එල්ලංගාව පිළිබඳ සාමාන්‍ය තොරතුරු

| මූලික තොරතුරු | විස්තර | විශේෂිත කරුණු |
|---|---|---|
| දිස්ත්‍රික්කය | කුරුණෑගල | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පොල්පිතිගම | |
| මැතිවරණ බලප්‍රදේශය | යාපහුව | |
| ගංගා ද්‍රෝණිය | මී ඔය | ගංගා ද්‍රෝනිය වර්ග කි.මී.1530 පුරා ව්‍යාප්ත වි ඇති අතර දිග කි.මී.118 වේ. |
| එල්ලංගාව | පොතුවැපිටිය | |
| ගොවිජන සේවා බල ප්‍රදේශය | රඹේ | |
| ග්‍රාමනිලධාරී කොට්ඨාශ | 358,නියදවනය | |
| ජලපෝශක ප්‍රදේශයේ නම | | |
| පැහැදිළි ජල පා්ෂක සංඛාව | | |
| කෘෂිකාර්මික කටයුතු සදහාහා භාවිතා කරන වැව් සංඛ්‍යාව | 6 | |
| වනාන්තර ප්‍රදේශ හෙක් | 3.6 | |
| එල්ලංගාව තුල ජීවත්වන පවුල් සංඛ්‍යාව | 92 | |
| ගෙවතු හෙක් | 37 | |
| එල්ලංගාවට අයත් වැව් වල මුළු ජල ධාරිතාවය | අක්කර අඩි 35.5 | |
| පුණරුත්ථාපනයට යොමු කල වැව් සංඛාව | 4 | |
| පුණරුත්ථාපනයට යොමු නොකල වැව් සංඛාව | 02 | |

**එල්ලංගාවට අයත් වැව් සම්බන්ධ මූලික තොරතුරු**

දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරන ලද එල්ලංගාවට අයත් වැව් පිලිබද තොරතුරු


| වැවෙහි නම | ග්‍රාම නිලධාරි වසම | භාවිතයටගනු ලබන සහ අත්හරින ලද වැවක්ද යන්න | ධාරිතාවය( අක්කර අඩි) | එම වැවේ ප්‍රතිලාභී ගොවි පවුල් සංඛ්‍යාව | වැවෙන් පෝෂණය වන වගා භූමි ප්‍රමාණය (අක්කර) | භූගෝලීය ඛණ්ඩාංක | |
|---|---|---|---|---|---|---|---|
| පොතුවැපිටිය මහවැව | 358,නියදවනය | භාවිතයට ගනු ලැබේ | 18 | 56 | අක්කර. 66 රූඩ් 3 | 7.8221 | 80.3591 |
| පොතුකොල වැව | 358,නියදවනය | භාවිතයට ගනු ලැබේ | 7 | 22 | අක්කර. 40 | 7.8217 | 80.3566 |
| වරාවැව | 358,නියදවනය, | භාවිතයට ගනු ලැබේ | 3.5 | 36 | අක්කර. 26 රූඩ් 3 | 7.8221 | 80.3653 |
| පූලින් පිටිය වැව | 358,නියදවනය | භාවිතයට ගනු ලැබේ | 4 | 6 | අක්කර. 6 | 7.8165 | 80.3703 |
| මුළු එකතුව | | | 32.5 | 120 | අක්කර. 138 රූඩ් 6 | | |

**මූලාශ්‍රය - සම්පත් පැතිකඩ - පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**පොතුවැපිටියඑල්ලංගාවට අයත් වැව් ආශ්‍රිත භූමි පරිබෝජනය සම්බන්ධ තොරතුරු**

වගු අංක 04 .358 නියදවනය ග්‍රාම නිළධාරි වසමට අයත් වැව් ආශ්‍රිත භූමි පරිබෝජනය සම්බන්ධ තොරතුරු

| අනු අංකය | ග්‍රාම නිළධාරි වසම | වැව | මහා/ මධ්‍ය/ කුඩා | ජල ධාරිතාව (අක්/අඩි) | ජලාශයේ ප්‍රමාණය | | | කුඹුරු පෝෂක ප්‍රමාණය | | | වගා කරන පවුල් ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | අක් | රූඩ් | පර්චස් | අක් | රූඩ් | පර්චස් | |
| 01 | 358 නියදවනය | | | | | | | | | | |
| 02 | | | | | | | | | | | |
| 03 | | පොතුකොල වැව(පොතුවැපිටියඑල්ලංගාවට අයත් වේ) | කුඩා | 7 | 3 | 0 | 3 | 40 | 0 | 0 | 22 |
| 04 | | ඉහල වැව | කුඩා | 4 | 4 | 0 | 0 | 13 | 2 | 0 | 32 |
| 05 | | පහළවැව | කුඩා | 1 | 4 | 2 | 0 | 15 | 3 | 0 | 7 |
| 06 | | පොතුවැපිටිය මහ වැව (පොතුවැපිටියඑල්ලංගාවට අයත් වේ) | කුඩා | 18 | 8 | 0 | 25 | 66 | 3 | 0 | 56 |
| 07 | | ගෙදරගාව වැව | කුඩා | 3 | 5 | 3 | 16 | 57 | 2 | 0 | 49 |
| 08 | | පච්චගොල්ල වැව | කුඩා | 4 | 4 | 0 | 0 | 23 | 1 | 0 | 17 |
| 09 | | සියඹලාගහමුල වැව | කුඩා | 4 | 4 | 2 | 0 | 8 | 1 | 0 | 6 |
| 10 | | පුලිංපිටිය වැව (පොතුවැපිටියඑල්ලංගාවට අයත් වේ) | කුඩා | 4 | 2 | 0 | 0 | 6 | 0 | 0 | 6 |
| 11 | | වෙදාගේ වැව | කුඩා | 1 | 1 | 0 | 0 | 21 | 1 | 0 | 8 |
| 12 | | සුමංගල වැව | කුඩා | 1 | 1 | 0 | 0 | 12 | 2 | 0 | 4 |
| 13 | | වරා වැව(පොතුවැපිටිය එල්ලංගාවට අයත් වේ) | කුඩා | 3.5 | 2 | 1 | 1 | 26 | 3 | 0 | 36 |



පොතුවැපිටිය එල්ලංගාවේ පිහිටීම
N
LEGEND
Location
LAKE
POTHUKOLA TANK
POTHUPITIYA TANK
WARA WEWA
PULANPITIYA TANK
0 100 200 300 m
Source : Google Satallite Images & GPS Tracking
Designed by : GIS UNIT NWP
Date : 2024.11.29
154200
154500
154800
155100
155400
291000
290800
290600
290400
290200

පොතුවැපිටිය එල්ලංගාව තුල මුලින්ම පිහිටා තිබෙන්නේ පොතුකොල වැවේය. එහි ජල ධාරිතාව අක්කර අඩි 07පමණ වන අතර අක්කර 03ක ප්‍රමාණයක වැව පැතිරි ඇත. එහි උල්පත් කිසිවක් පිහිටා නොමැත. එම වැවෙන් කුඹුරු ගොවිතැන් කරන පිරිස 14ක් වේ. වර්ෂා කාලයේ දී මීටර් 400ක් දුරට පමණ ඇති ප්‍රාදේශිය සභා මාර්ගයක කාණුවක් දිගේ පොතුවැපිටිය මහ වැව දක්වා ජලය ගලා ගෙනයනු ලබයි. පොතුවැපිටිය මහ වැව ජල ධාරිතාව අක්කර අඩි 18 පමණ වන අතර අක්කර 08ක ප්‍රමාණයක වැව පැතිරි ඇත. කුඹුරු අක්කර 66 පමණ වගා කරන අතර ගොවි පවුල් 56ක් එම වැවේ ප්‍රතිලාභින්වේ. වර්ෂා කාලයේ දී වාන් වතුර බැස යාමට වාන් ඇලක් නොමැති අතර කුඹුරු මැදින් මීටර් 350 දුරින් පිහිටි වරා වැවට ජලය මුදාහරි. වරා වැවේ ජල ධාරිතාව අක්කර අඩි3.5 පමණ වන අතර අක්කර 02 ක ප්‍රමාණයක වැව පැතිරි ඇත. කුඹුරු අක්කර 26 පමණ වගා කරන අතර ගොවි පවුල් 36ක් එම වැවේ ඍජු ප්‍රතිලාභින්වේ. එහි උල්පත් කිසිවක් පිහිටා නොමැති අතර වර්ෂා කාලයේ දී මීටර් 1500ක් දුරට ඇති වාන් ඇල දිගේ පූලංපිටිය වැව දක්වා ජලය ජලය ගලා ගෙන යයි. පූලංපිටිය වැවේ ජල ධාරිතාව අක්කර අඩි 4 පමණ වන අතර අක්කර 02ක ප්‍රමාණයක වැව පැතිරි ඇත. කුඹුරු අක්කර 6 පමණ වගා කරන අතර ගොවි පවුල් 6ක් එම වැවේ ඍජු ප්‍රතිලාභින් වේ. එහි උල්පත් කිසිවක් පිහිටා නොමැත. අතර වර්ෂා කාලයේ දී පමණක් සියළුම වැව් පිරි වාන් මට්ටමට ලගා වේ. යල කන්නයේ දී බෙත්ම ලෙස ඉතාමත් සිමිත කුඹුරුප්‍රමාණයක් වගා කරයි. මෙම එල්ලංගාවට අයත් වැව් 04 ම වසරේ මහ කන්නයේ දී වාන් මට්ටමට ලගා වන අතර වාර්ෂික නඩත්තු වැඩ සටහනක් සකස් වි නොමැත. එය ප්‍රදේශයේ ජීවත් වන ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය හා කෘෂිකාර්මික කටයුතු සඳහා දැඩි බලපැමක් සිදුකරයි. මේ තුලින් ජනතාගේ කෘෂි ආර්ථික නිෂ්පාදනය හා ජීවන අපේක්ෂාව පහල මට්ටමකට තල්ලු වී ඇත.

## 1.4 පොතුවැපිටිය එල්ලංගාව තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත් කම

පොතුවැපිටිය එල්ලංගාවේ වැව් 04න් දල වශයෙන් අක්කර 138 පමණ වන භූමි ප්‍රමාණයක වී වගා කරනු ලබයි. එමගින් ප්‍රතිලාභ ලබන ගොවී පවුල් සංඛ්‍යාව 120ක් පමණ වේ. දැනට මෙම ප්‍රයෝජනයට ගන්නා වැව් හතරේ ජල ධාරිතාවය අක්කර අඩි 33 පමණ වන අතර යල සහ මහ කන්න වල මෙම ප්‍රදේශයේ වී නිෂ්පාදනය ආසන්න වශයෙන් අක්කරකට බුසල් 80 පමණ වේ. දේශගුණ සුහුරු වයාපෘතිය යටතේ 2025 වර්ෂයේදි ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම්කර ඇති අතර ප්‍රතිසංස්කරණය කිරිමෙන් අනතුරුව මෙම වැව් වල ධාරිතාවය අක්කර අඩි 50 දක්වා ඉහළ නැංවෙන අතර ඒ අනුව වී නිෂ්පාදනය අක්කරකට බුසල් 140 දක්වා ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ.

සාමාන්‍ය වර්ෂාව පවතින කාලවල දි මහ කන්නයේ දි කුඹුරු අක්කර 138 පමණ වගා කරන අතර යල කන්නයේ දි අක්කර 37 පමණ වගා කටයුතු සිදුකරයි. මහ කන්නයේ දි රටකජු අක්කර 10 පමණ වගා කරන අතර නියං කාලයේ දි වගා කරන්නේ අක්කර 07 පමණ භූමියකවේ. ගොඩ ගොවිතැන් කිරිමේ දි උස් බිම් වල යල කන්නයේ දි අතුරු භෝග අක්කර 18 පමණ හා මහ කන්නයේ දි අක්කර 4 පමණ වගා කරයි.

බහු වාර්ෂික භෝග අක්කර 27 පමණ වගා කරනු ඇත. ගෙවතු ආශ්‍රිතව අතුරු භෝග යල කන්නයේ දි අක්කර 04 හා බහු වාර්ෂික භෝග අක්කර 11.5 පමණ වගා කරනු ඇත.

මෙසේ සාමාන්‍ය ජන ජීවිතයට සෘජුව බලාපන මෙම එල්ලංගා පද්ධතිය විවිධ මානව හා පාරිසරික ක්‍රියාකාරකම් හේතුවෙන් පරිහානියට පත්වෙමින් පවතී. ප්‍රධාන වශයෙන්ම අනවසර වගාකිරීම හා හේන් වගාව සඳහා වනාන්තර විනාශ කිරීම හා ජල පෝෂක ප්‍රදේශ වල සිදුකරන මහා පරිමාණ වගා කිරීම් ආදිය නිසා සිදුවන පාංශු ඛාදනය වැනි හේතු මත වැව් ගොඩවීමත්, නිසි නඩත්තුවක් නොමැතිවීමෙන් ඇළ වේලි විනාශ වීම හේතුවෙන් ජල කළමනාකරණය දුරුවල වීමත්, වැව් ආශ්‍රිතව අතීතයේ සිට පැවතිය යුතු ප්‍රධාන අංග විනාශ වීමත් වැනි කරුණු හේතුවෙන් මෙම එල්ලංගා පද්ධතිය පරිහාණියට පත්වෙමින් ඇත. මේ හේතුවෙන් එල්ලංගා පද්ධතිය මගින් බලාපොරොත්තු වන ඵලදායිතාවය පහළ යමින් පවතී.

මෙම තත්ත්වය මග හරවා ගැනීමට නම් මනා කළමනාකරණයකින් යුක්තව එල්ලංගාව හා සම්බන්ධ වනසියලු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් යුතු කළමනාකරණ ක්‍රියාවලියක් පැවතිම අවශය වේ. ඒ අනුව එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර පොතුවැපිටිය එල්ලංගාව  ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අවධානය යොමු කර ඇත. එහිදී එල්ලංගා කලමණාකරන කමිටුවට එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමට ව්‍යාපෘතිය සහාය ලබාදේ.

කෙසේ වුවද එල්ලංගාවේ පිහිටි වැව් 06න් 04ක් එල්ලංගා සංවර්ධන ප්‍රවේශය (Cascade Development Approach) උපයෝගී කරගනිමින් ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර එහිදී මුළු පද්ධතියේ තිරසර පැවැත්ම තහවුරු වන ආකාරයට එල්ලංගාව සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරයි.

## 1.5 එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වාරි කලමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කලමණාකරන ක්‍රමවේදයකි. එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එනම්,"**එල්ලන්**" සහ "**ගාව**"යන වචන දෙක එකතු වී සකස් වී ඇත."**එල්ලන්**" යනු එල්ලෙන යන්නයි. "**ගාව**" යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි. එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි. ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙසද නම් කර ඇත. එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමේලඅදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා එල්ලංගාවට කලමණාකරන සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. එසේම එල්ලංගා කලමණාකරන කමිටු නීතිගත කිරීමටද අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කලමණාකරන කමිටු 54ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත

කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කලමණාකරන කමිටු 54 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කලමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඒවා නම්,

1. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
2. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව
3. පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
4. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
5. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
6. ප්‍රාදේශීය ලේකම් කාර්යාල
7. ගොවි සංවිධාන
8. ප්‍රජා මූල සංවිධාන
9. ජල සම්පත් මණ්ඩලය
10. ආපදා කලමණාකරන කාර්යාංශය
11. පොලිස් දෙපාර්තමේන්තුව
12. ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
13. මධ්‍යමපරිසර අධිකාරිය
14. පෞද්ගලික අංශය
15. ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව යන ආයතන වේ.

එල්ලංගා කලමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි.රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇති අතර ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහන් අංක 03 මගින් දක්වා ඇත.




රූපසටහන 03 - එල්ලංගා පද්ධති කලමණාකරනය සඳහා වර්තමානයේ සම්බන්ධිත ප්‍රධාන ආයතන

## 1.6 එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය

එල්ලංගාවක්, ජල පෝෂක ප්‍රදේශයේ මතුපිට මෙන්ම භූගත ජල මට්ටම සුරක්ෂිත කරන අතර එහි ප්‍රතිපලයක් ලෙස ජනතාවට ආහාර පිසීම වැනි ගෘහ කටයුතු සහ වගා කටයුතු වලට ජලය සපයනු ලබයි. රූප සටහන් අංක 02 අනුව රාජ්‍ය,පෞද්ගලික සහ ප්‍රතිලාභී පාර්ශවකාර ආයතන එල්ලංගාව ආරක්ෂා කරනු ලබයි. එසේ වුවද අංක 3 කොටසේ සඳහන් පරිදි නියමිත ලෙස පාර්ශවකරුවන්ගේ අවධානය යොමු නොවීම සහ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව දැඩි ලෙස පරිහානියට පත්ව ඇත. එල්ලංගාව ආරක්ෂාව කිරීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ වීමට වඩාත් යෝග්‍ය ආයතන ව්‍යුහයක් නොමැති වීම නිසා එල්ලංගාව තව දුරටත් හානියට ලක් විමේ ප්‍රවනතාවක් පවතී.එම නිසා එල්ලංගා කළමනාකරණ කමිටුව වැනි සම්බන්ධීකරණ ආයතනයක් එල්ලංගාවආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට වඩාත් අවශ්‍ය වී ඇත.

මෙරට ඒකාබද්ධ කළමණාකරණ වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉන් මහවැලි ව්‍යාපාරයහා ඉන්මාස් වැඩ සටහන ප්‍රමුඛතාවය ගනී . මෙමවැඩසළටහන් ජලය හා බැඳුනු මහා වාරිමාර්ග පදම් කරගත් ව්‍යාපාර වේ. මෙම වැඩ සටහන් අතුරෙන් 1984 ආරම්භ වූ ඉන්මාස් වැඩ සටහන (මහා වාරිමාර්ග පුණරුත්ථාපන වැඩ සටහන MIRP හා වාරිමාර්ග පද්ධති කළමනාකරණ වැඩ සටහන් ISMP ව්‍යාපෘති) වැදගත් තැනක් ගනු ලබන්නේ එයද ලෝක බැංකු වේ අනුග්‍රහයෙන් මෙරට ක්‍රියාත්මක වී අද දක්වාම සාර්ථකව ක්‍රියාත්මක වන බැවිනි. මෙරට මහ ගොවි ජනපද ව්‍යාපාර වල ගොවි සංවිධාන පිහිටු වී මේ ආරම්භක පියවරක් ගනු ලැබුවේ මෙම ඉන්මාස් වැඩ සටහන තුලින්ය. මෙම ගොවිජන පද ව්‍යාපාර කළමනාකරණය කිරීම ව්‍යාපාර කළමනාකරණ කමිටුව මගින් සිදු වේ . මෙම එල්ලංගාව කළමනාකරණය කිරීම ද එල්ලංගා කළමනාකරණ කමිටුව මගින් ඉට කිරී මට ලෝක බැංකුව අපේක්ෂා කරයි. ඉහතින් කියවෙන ව්‍යාපාර කළමනාකරණ කමිටුව හා මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බොහෝ දුරට සමානකම් දක්වයි. මෙහි කළමනාකාරිත්වය රජයේ නිලධාරින්ගේ හා එල්ලංගාවේ ප්‍රතිලාභීන් හවුල් කරගෙන හවුල් කළමනාකරණයක් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. ඉහත අංක දරණ ජේදයට අනුව මෙම එල්ලංගා කළමනාකරණ කමිටුවේ අන්තර්ගතය සටහන් කර ඇත. ඉතා වේගවත්ව හායනයට යමින් පවතින ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති එල්ලංගාව නැවතත් තිරසරව පවත්වාගෙන යාමට මෙම එල්ලංගා කළමනාකරණ කමිටුව බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 1.7 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ අවශ්‍යතාවය

එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා අතීතයේ පැවති සාම්ප්‍රදායික ග්‍රාමීය ආයතන ව්‍යුහය හා සමාජ ආර්ථික වත් පිළිවෙත්, සම්ප්‍රදායන් හා චාරිත්‍ර වාරිත්‍ර නිසා එල්ලංගාවේ තිරසර පැවැත්ම තහවුරු වූ අතර ක්‍රමානුකූලව මෙම තත්වයන් වෙනස් වීමත් සමග එල්ලංගා පද්ධතිය හායනයට පත් විය. වර්තමානය වන විට එය ඉතාමත් වේගයෙන් හායනයට ලක් වෙමින් පවතී. එල්ලංගා පද්ධති නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී, සම්පත් හායනය වලක්වා ගැනීමේදී හා මනා කලමණාකරනයක් කිරීමේදී එල්ලංගාවේ වර්තමාන තත්වය සහ පවතින ගැටළු හා ඒවා අතර ඇති වඩාත් උග්‍ර ගැටළු හඳුනා ගැනීම ඉතාමත් වැදගත් වේ. මේ සඳහා එල්ලංගාවේ භූගෝලීය ගැටළු, ජල විද්‍යාත්මක ගැටළු, පරිසර විද්‍යාත්මක ගැටළු හා සමාජ ආර්ථික ගැටළු හඳුනා ගත යුතු වේ. එසේම එල්ලංගාව තුල වර්තමානයේ සිදුවන මානව ක්‍රියාකාරකම් පිළිබඳව, විවිධ ක්‍රමවේද ඔස්සේ එනම් හරස්කඩ චාරිකා, ද්විතීය දත්ත සහ කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් තොරතුරු එකතු කර එල්ලංගා පැතිකඩක් සකස් කරනු ලබයි.මෙම එල්ලංගා පැතිකඩ එල්ලංගා පද්ධති කලමණාකරනයේදී මූලික අවශ්‍යතාවයකි.

## 1.8 එල්ලංගා පැතිකඩක් සකස් කිරීමේ දී අනුගමනය කලක්‍රමවේදය

පොතුවැපිටිය එල්ලංගා පැතිකඩ සකස් කිරීම සඳහා මූලාශ්‍ර කිහිපයක් ඔස්සේ තොරතුරු ලබාගන්නා ලදී.

- හරස්කඩ චාරිකා
- ද්විතීය දත්ත
- කණ්ඩායම් සාකච්ඡා

ඒ අතර ප්‍රධාන වූ අතර ද්විතීය දත්ත ලෙස ව්‍යාපෘතියේ සංවේදී කලාප සඳහා සකස් කරන ලද කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම, ඉංජිනේරු සමීක්ෂණය, ජල විද්‍යාත්මක තක්සේරුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වලින් ලබා ගත් තොරතුරු භාවිතා කරන ලදී.

මීට අමතරව ප්‍රාථමික දත්ත ජනනය කිරීම සඳහා හරස්කඩ චාරිකාවක් ද (Transect Walk) සියලු පාර්ශවකාර සංවිධාන වල සහභාගීත්වයෙන් සිදුකරන ලදී. එල්ලංගාවේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශ එනම්, ඉහළ ගනේගම, මැද ගනේගම, පහළ ගනේගම, සියඹලාවත්ත වැව හා අවසන් වැව වන පොතුවැපිටිය යන වැව් පිලිබඳව 2019.12.20,21,22 දින පැවැති හරස්කඩ චාරිකාවේ දී තොරතුරු ලබාගන්නා ලදී. මේ සඳහා කණ්ඩායම් 04ක් පහත පරිදි යොදවා තොරතුරු රැස් කරන ලදී.

- හරස්කඩ චාරිකා පිළිබඳ තොරතුරු-

| දිනය | 2019-12-20.21.22 | | |
|---|---|---|---|
| කණ්ඩායම | ආවරණය කරන ලද ප්‍රදේශය | ආරම්භක ස්ථානය | සහභාගී වූ සාමාජිකයන් ගණන |
| 01 | පොතුවැපිටියමහ වැව | නියදවනය සමිති ශාලාව | 11 |
| 02 | පොතුකොල වැව | නියදවනය සමිති ශාලාව | 10 |
| 03 | වරා වැව | නියදවනය පාසල අසල | 05 |
| 04 | පුලංපිටිය වැව | නියදවනය සමිති ශාලාව | 10 |

සාමාන්‍යයෙන් අතීතයේදී හරස්කඩ චාරිකාවේදී ගමන් මාර්ගයේ මීටර් 100න් 100ට තොරතුරු ලබාගත්තද එල්ලංගා පද්ධතියක් සමාන්තර රේඛාවක නොපිහිටන බැවින් (විසිරී පවතින බැවින්) එල්ලංගාවේ වැව්වල පිහිටීම අනුව එල්ලංගාවේ භූමි ප්‍රමාණය කොටස් වලට වෙන් කර එම කොටස් අනුව කණ්ඩායම් කර බහුඅශ්‍ර ක්‍රමයට තොරතුරු රැස්කරන ලදී. එහිදී අදාළ ප්‍රදේශයේ භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක තොරතුරු, ජල විද්‍යාත්මක තොරතුරු, පරිසර විද්‍යාත්මක තොරතුරු, සමාජ ආර්ථික තොරතුරු, සම්පත් භායනයේ

බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කරගන්නා ලදී. හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන්, ගොවි සංවිධාන සාමාජිකයින් හා සියලු රාජ්‍ය ආයතන වල නිලධාරීන් සහභාගීවූ අතර චාරිකාවෙන් එක්රැස් කරගන්නා ලද තොරතුරු වල වලංගුභාවය තහවුරු කර ගැනීම සඳහා 2024-06-28 දින නැවත ඊට අදාළ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් ගනේගම රජමහා විහාරයේ දී සාකච්ඡාවක් පවත්වන ලදි.



විශේෂයෙන්ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වන අතර එල්ලංගාව අධ්‍යයනය කරනු ලබන අයට එල්ලංගාව පිලිබඳව තොරතුරු ලබාගැනීමේ දී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේදී බෙහෙවින් ඉවහල්වනු ඇත.

මින්

## 1.9 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ ඒවායේ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කලමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාව කලමණාකරනය කල යුතුවේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කලමණාකරන සැලැස්මසකස් කරනු ලබයි.

2.4.1. ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ(Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම.

2.4.2. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපායමාර්ගික මැදිහත්වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, කිරීමේ කාලවකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කලමණාකරන මූ ලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම.

2.4.3. එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

## 1.10 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ වැදගත්කම

එල්ලංගා පැතිකඩ, ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසා එනම් වර්ෂාව අඩු වීම, අවිධිමත් හේන් වගාව, වනාන්තර එළිපෙහෙළි කිරීම, සත්ව පාලන කටයුතු, කැලි කසල බැහැර කිරීම, පස් කැපීම, පතල් කැපීම සහ වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ කිරීම යනාදී හේතු නිසා එල්ලංගාව හානියට පත්වී ඇති ආකාරය, එහිදි පාර්ශවකරුවන් වගකිව යුතු ක්ෂේත්‍ර හා ඔවුන්ගේ වගකීම් පිලිබඳව විවිධ මානයන් ඔස්සේ පාර්ශවකරුවන් හා ගොවි ප්‍රජාව අතර තොරතුරු හුවමාරු කරගැනීම සඳහා බෙහෙවින් ඉවහල් වේ. එල්ලංගා පැතිකඩ ප්‍රතිපත්ති සම්පාදකයින්ට, ප්‍රාදේශීය දේශපාලකයින්ට, පාර්ශවකාර ආයතන වලට සහ ගොවි ප්‍රජාවට එල්ලංගාව පිලිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට සහ එල්ලංගාව ආරක්ෂා කර ගැනීම සඳහා නිවැරදි තීරණ ගැනීමට තවදුරටත් වැදගත් වේ. එල්ලංගා පද්ධතිය ආරක්ෂා කර ගැනීමට සාමූහිකව හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුක්තව එල්ලංගා කලමණාකරන මූලික සැලැස්මක් සැකසීම (Cascade Management Plan) සඳහා එල්ලංගා පැතිකඩ විශේෂයෙන්ම වැදගත් වේ. මෙහි සඳහන් මූලික එල්ලංගා කලමණාකරන සැලැස්ම එල්ලංගා කලමණාකරන කමිටුව විසින් සකස් කරන ලද එල්ලංගා පැතිකඩ පදනම් කරගෙන සකස් කරනු ලබයි.

# 2 එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමේ දී අනුගමනය කරන ලද ක්‍රමවේදය

දේශගුණ සුහුරුවාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, පොතුවැපිටිය එල්ලංගාවේ පවතින තත්වය විශ්ලේෂණය කිරීමෙන් පසුව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා සියලු පාර්ශවකාර ආයතනසම්බන්ධිත එල්ලංගා කලමණාකරන කමිටුව වැනි ආයතනයක අවශ්‍යතාවය තහවුරු විය. මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා එල්ලංගා කලමණාකරනය සඳහා ප්‍රධාන කාර්යයක් ලෙස විද්‍යානුකූල හා සහභාගීත්ව ප්‍රවේශයකින් යුත් එල්ලංගා කලමණාකරන සැලැස්මක් අවශ්‍ය බවටද දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියට අවබෝධ විය.එල්ලංගා කලමණාකරන කමිටුවට විධිමත් එල්ලංගා පැතිකඩක් සහ එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කිරීමට එය උදව්වක් විය.පිලිවෙලින් එල්ලංගාව අධ්‍යනය කිරීම හා ද්විතීය හා ප්‍රාථමික දත්ත හා තොරතුරු එකතු කිරීම, තොරතුරු ජනනය කිරීම එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ පූර්ව අවශ්‍යතාවයක් විය.

එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම ක්ෂේත්‍ර මූලික ක්‍රියාකාරකම් ඇතුලත් බහුවිධකාර්යයකි. ඒසඳහා එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීමට පෙරඑල්ලංගා පැතිකඩ සකස් කල යුතු අතර එහිදී එල්ලංගාවේ භූවිද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, ජලවිද්‍යාත්මක, සිතියම් විද්‍යාත්මක හා සමාජ පැතිකඩ තක්සේරු කිරීම සඳහා සහභාගීත්ව හා බහුපාර්ශවීය ක්‍රමවේද භාවිතා කරනු ලබයි. දත්ත උත්පාදනය, ත්‍රිමානකරණය, දත්ත විශ්ලේෂනය, වාර්තා ලිවීම, සැලැස්ම සැකසීම සහ පාර්ශව කරුවන්ගෙන් ඒවායේ නිවැරදිභාවය තහවුරු

කරගැනීම සඳහා බහුවිධ දක්ෂතා ඇති පුද්ගලයින් අවශ්‍ය වේ. මෙම සියලුම කාර්යයන් ලෝක බැංකු කාර්ය මණ්ඩලයේ උපදෙස් ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ නිලධාරීන් විසින් ඉටුකරනු ලැබීය. එල්ලංගා කලමණාකරන සැලැස්ම සැකසීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂි කර්ම ව්‍යාපෘතිය සහ හවුල්කාර ආයතන එකතු වී පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.

I. රැස්වීම් පැවැත්වීම
II. ද්විතීය දත්ත එකතු කිරීම
III. හරස්කඩ වාරිකාව වැනිසහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර ප්‍රාථමික දත්ත උත්පාදනය කිරීම
IV. එල්ලංගාව මුහුණ දෙන අභියෝග හඳුනා ගැනීම
V. එකතු කරන ලද හා උත්පාදනය කරන ලද දත්ත හා තොරතුරු මත පුරෝකථන කිරීම
VI. එල්ලංගා පැතිකඩ සැකසීම
VII. ගැටළු ගස වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර උග්‍ර ගැටළු හඳුනා ගැනීම
VIII. යුගල සැසඳීම වැනි සහභාගීත්ව තාක්ෂණික ක්‍රම භාවිතා කර කඩිනමින් අවධානය යොමු කල යුතු උග්‍ර ගැටළු හඳුනා ගැනීම
IX. එල්ලංගා සැලැස්ම සැකසීම
X. පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා කලමණාකරන සැලැස්මේ නිවැරදිතාවය තහවුරු කර ගැනීම
XI. එල්ලංගා කලමණාකරන කමිටුවේ විශේෂ රැස්වීමකදී උග්‍ර ගැටළු විසඳීම හෝ අවම කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ගික සැලසුම් සකස් කිරීම
XII. යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා කෙටිකාලීන (Short Term), මධ්‍යකාලීන (Medium Term) හා දීර්ගකාලීන (Long Term) වශයෙන් බෙදා වෙන් කරන ලද ප්‍රායෝගික කාලවකවානු තීරණය කිරීමහාදල ඇස්තමේන්තුවක් සකස් කිරීම ආදිය එල්ලංගා කලමණාකරන කමිටුවට පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස එල්ලංගා කලමනාකරන සැලැස්මට ඇතුලත් කරන ලදී.
XIII.

## 3.පොතුවැපිටිය එල්ලංගාවේ වර්තමාන පැතිකඩ


## 3.1භූගෝලීය (Geographical ) තොරතුරු

පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුරට හාමහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මායිම්ව 358 නියදවනය ග්‍රාම නිලධාරි කොට්ඨාශ තුල පොතුවැපිටිය එල්ලංගාව පිහිටා ඇත. නැගෙනහිරින් හාතිගමුව ග්‍රාම නිලධාරි වසමත්, දකුණින් මීගස්වැව ග්‍රාම නිලධාරිවසමත් බටහිරෙන් මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දැහැනැග්ගම කරඹේ ග්‍රාම නිලධාරි වසමත්, උතුරින් මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කට්ටඹුවාව ග්‍රාම නිලධාරි වසමත් මායිම් ලෙස පිහිටා ඇත. මෙම එල්ලංගාව හෙක්ටයාර 562.96ක භූමියන් තුල පැතිරී ඇත.භූ විෂමතාවය අනුව සලකා බලන විට සමස්ථ භූමියම තැනිතලා ස්වරූපයක් ගනි. පොතුකොල වැවේ සිට මීටර් 200 පමණ දුරින් පොතුවැපිටිය මහ වැව පිහිටීමත් එම වැව් ආශ්‍රිතව තරමක් උස් කළුගල් තලාවක් පිහිටා ඇත.වරා වැව සිට  අනෙකුත් ප්‍රදේශ තැනිතලා ස්වරූපයක් ගනී. මෙහි උන්නතාංශය මුහුදු මට්ටමේ සිට අඩි 220 පමණ මට්ටමේ පවති.

### 3.2 භූ විද්‍යාත්මක (Geological) තොරතුරු

මෙම එල්ලංගව අයත් ප්‍රාදේශීය කොට්ඨාසයේ පස පිළිබද සලකා බැලීමේදි පාංශු බාණ්ඩ තුනක් මෙම ප්‍රදේශයේ දැකිය හැකිය. දුර්වල ජල වහනයක් පවතින රතු දුඹුරු පස,රතු දුඹුරු පසෙහි ක්ෂාරිය නොවන දුඹුරු පස හා දියළු පස එම පස් වර්ග වේ. ඒ අනුව මෙම එල්ලංගාවේ බහුලවම දක්නට ලැබෙන්නේ රතු දුඹුරු පසෙහි ක්ෂාරිය නොවන දුඹුරු පසකි. එහෙත් කුඹුරු වල ලොම් පසක් පවති. හෙක්ටයාර 467.1 පුරා ව්‍යාප්ත වී ඇති මෙම එල්ලංගාවේ මුළු භූමි ප්‍රමාණයෙන් අක්කර 19 පමණ වනාන්තර ප්‍රදේශයක් වන අතර කුඹුරු ලෙස අක්කර 370 පමණ ද වෙනත් බෝග සඳහා සහ ගෙවතු සඳහා අක්කර 392 පමණ ද යොදා ගෙන ඇත.

**සිතියම් අංක 04 - පොතුවැපිටිය එල්ලංගාව ආශ්‍රිතව පස**




මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ ග්‍රන්ථය ( දේශගුණ සුහුරු ව්‍යාපෘතිය)


## 3.3 ජල විද්‍යාත්මක (Hydrological) තොරතුරු

මෙම එල්ලංගාව මී ඔය ගංගා ද්‍රෝණිය තුල පිහිටා ඇති අතර මී ඔය ගංගා ද්‍රොණිය උප ද්‍රෝණි අටකට වෙන් කර ඇත. පොතුවැපිටිය එල්ලංගාව එහි තුන්වන උප ද්‍රොණියේ පිහිටා ඇත. මෙම එල්ලංගාවට අයත් වැව් සඳහා වාර්ෂිකව හා මාසිකව ලැබෙන වර්ෂාපතනය ගණනය කිරීමේ දී මධ්‍යස්ථානය තුනකින් මෙම ගණනය කිරීම සිදු කරනු ලබයි.

එල්ලංගාවට අයත් ප්‍රතිසංස්කරනය කරනු ලබන වැව් හතර ඉහළ සඳහා වාර්ෂික හා මාසික වර්ෂාපතනය ගණනය කිරිම මැදියාව වැව මධ්‍යස්තානය, අතරගල්ල, ඉගිනිමිටිය මධ්‍යස්ථානය මගින් ද සිදු කරනු ලබයි.

ඒ අනුව එක් එක් වැව සම්බන්ධ වාර්ෂික හා මාසික වර්ෂාපතන දත්ත පහත පරිදි වේ.

**සිතියම් අංක 05- මී ඔය ද්‍රෝණිය තුල පොතුවැපිටිය එල්ලංගාවේ පිහිටීම**




මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ වාර්තාව ( දේශගුණ සුහුරු ව්‍යාපෘතිය)

**දේශගුණය**

මෙම ප්‍රදේශය අන්තර් මධ්‍ය දේශගුණික කලාපයටත්, වියළි දේශගුණික කලාපයටත්, තෙත් කලාපයට අයත් ප්‍රදේශයක් වේ. මඩහපොල, මඩහපොල කන්ද, මැද කන්ද, අඟුල්ගමුව, ඉම්භාමිනේගම, පරගහඇල යන ග්‍රාම නිලධාරි කොට්ඨාස අන්තර් මධ්‍ය කලාපවලට වඩා තෙත් කලාපීය දේශගුණයට අයත් වේ. මී ඔයෙන් උතුරු දෙසට සියඹලන්ගමුව ඔය දක්වා වූ භූමි භාගය අන්තර් මධ්‍ය දේශගුණික කලාපීය ලක්ෂණ දක්නට ඇත. කෘෂි කාර්මික කාලගුණික කලාප වශයෙන් බෙදා වෙන් කිරීමේ දී අයි. එල්. 03 සහ ඩී. එල්. 03 යන කලාපවලට බෙදා දක්වා ඇත.

**වර්ෂාපතනය (මිලි මීටර්)**

| මාසය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
| ජනවාරි | 0.0 | 19.8 | 130.7 | 81.9 | 52.79 |
| පෙබරවාරි | 156.0 | 5.2 | 50.1 | 55.6 | 140.39 |
| මාර්තු | 61.0 | 16.2 | 119.0 | 17.2 | 116.30 |
| අප්‍රේල් | 253.3 | 104.2 | 135.2 | 349.3 | 0 |
| මැයි | 2.5 | 264.4 | 540.3 | 138.4 | 97.7 |
| ජූනි | 71.0 | 134.9 | 58.3 | 5.6 | 5.09 |
| ජූලි | 5.5 | 112.7 | 82.5 | 102.0 | 9.2 |
| අගෝස්තු | 120.5 | 18.1 | 17.4 | 109.6 | 9.5 |
| සැප්තැම්බර් | 154.0 | 65.1 | 74.4 | 41.5 | 189.79 |
| ඔක්තෝබර් | 706.5 | 29.0 | 276.5 | 201.2 | 223.29 |
| නොවැම්බර් | 168.0 | 179.5 | 460 | 162.5 | 690.5 |
| දෙසැම්බර් | 360.3 | 230.2 | 15.2 | 229.5 | 252.10 |
| සාමාන්‍ය අගය | 171.55 | 98.28 | 163.3 | 124.53 | 148.89 |

(මූලාශ්‍රය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව - කොළඹ 07)

උෂ්ණත්ව අගයන්(සෙ.අ)

| මාසය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
| ජනවාරි | 20.3 | 21.5 | 22 | 21.6 | 26.1 |
| පෙබරවාරි | 22.4 | 21.5 | 21 | 20.9 | 27.5 |
| මාර්තු | 22.0 | 22.3 | 22 | 22.8 | 28.95 |
| අප්‍රේල් | 23.6 | 23.6 | 23.9 | 23.5 | 34.4 |
| මැයි | 25.6 | 25.1 | 24.5 | MA | 29.1 |
| ජූනි | 25.8 | 25.3 | 24.8 | 25.1 | 29.15 |
| ජූලි | 25.3 | 24.4 | 24.8 | 24.3 | 28.55 |
| අගෝස්තු | 24.7 | 24.7 | 24.7 | 24.3 | 29.7 |
| සැප්තැම්බර් | 24.2 | 24.3 | 24.9 | 24 | 27.5 |
| ඔක්තෝබර් | 22.8 | 24.2 | 23.7 | 23.4 | 27.6 |
| නොවැම්බර් | 23.0 | 23.1 | 23.3 | 21.7 | 27.9 |
| දෙසැම්බර් | 22.5 | 22.3 | 22 | 21.5 | 27.4 |
| සාමාන්‍ය අගය | 23.51 | 23.52 | 23.46 | 21.09 | 28.65 |


(මූලාශ්‍රය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව - කොළඹ 07)

වගු අංක 06 - පොතුවැපිටිය එල්ලංගාවට අයත් වැව් සඳහා වාර්ෂික හා මාසික වර්ෂාපතන සම්බන්ධ තොරතුරු

| වැවේ නම | ගණනය කරන මධ්‍යස්ථානය | සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය | මාසික වර්ෂාපතනය ඉහළ කාලසීමා |
|---|---|---|---|
| පොතුකොල වැව<br>වරාවැව<br>පුලංපිටිය වැව | මැදියාව මධ්‍යස්ථානය | මි.මි.1475 | ඊසානදිග මෝසමේ මුල් කාලපරිච්ඡේදය හා අන්තර් මෝසම් කාලසීමා |
| පොතුවැපිටිය මහ වැව | අතරගල්ල මධ්‍යස්ථානය | මි.මි.1093 | අන්තර් මෝසම් කාලසීමාව |


මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ වාර්තාව ( දේශගුණ සුහුරු ව්‍යාපෘතිය)

ප්‍රස්තාර අංක - 02 මැදියාව මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම





මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ වාර්තාව ( දේශගුණ සුහුරු ව්‍යාපෘතිය)

ප්‍රස්තාර අංක 03 - අතරගල්ල මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම




මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ වාර්තාව ( දේශගුණ සුහුරු ව්‍යාපෘතිය)

ප්‍රස්තාර අංක 04 - ඉහිනිමිටිය මධ්‍යස්ථානයට අයත් ප්‍රදේශ සඳහා සාමාන්‍ය මාසික වර්ෂාපතනය වෙනස්වීම




මූලාශ්‍රය - ජල විද්‍යාත්මක පර්යේෂණ වාර්තාව ( දේශගුණ සුහුරු ව්‍යාපෘතිය)

## 3.4 පරිසර විද්‍යාත්මක(Environmental) තොරතුරු

පොතුවැපිටිය එල්ලංගාව අවට පිහිටා ඇති වනාන්තර වර්ග ලෙස වියළි විවෘත වනාන්තර හා කටු පඳුරු සහිත ලඳු කැලෑ බහුලව දැකිය හැකි වේ. මෙම ප්‍රදේශයේ පිහිටි වනාන්තරය නිමලව වනාන්තරය ලෙස හඳුන්වයි. මෙහි විශාල ප්‍රමාණයේ ශාක වර්ග වශයෙන් සියඹලා, මයිල, පලු, වීර, දිවුල්, කරඳ හා කුඹුක් වැනි ශාක විශේෂ බහුලව පවතී. පඳුරු වශයෙන් අන්දර හා එරමිණියා විශාල වශයෙන් බහුලව පවතී.

මීට අමතරව මෙම එල්ලංගාවේ ශ්‍රී ලංකානු අලියා, දිවියන්, මුවන්, වල් මීහරකුන්, වල් ඌරන්, වඳුරන්, මොණරුන් වැනි සතුන්ද ඉත්තෑවන්, මීමින්නන් වැනි කුඩා සතුන්ද දැකිය හැක. මීට අමතරව උරග විශේෂ ලෙස තලගොයා, කබරගොයා, ගැට කිඹුලා, හැල කිඹුලන් හා සර්ප විශේෂ ලෙස නයා, පිඹුරා, පොළඟා, ඇහැටුල්ලා, වල් ගැරඬියා, අහරකුක්කා, මාපිලා, තෙල් කරවලා වැනි සතුන්ද කටුසු වර්ග ලෙස පලා කටුස්සා, ගරා කටුස්සන්, අං කටුස්සන් හා බෝදිලිමා වැනි විශේෂද හුනු විශේෂ ලෙස සුලභ ගේ හූනන්, තිත් හූනන් හා කිඹුල් හූනන් හමුවේ. මෙම ප්‍රදේශයේ දුර්ලභ ගනයේ පක්ෂීන් විශේෂ ලෙස අළු කොහා, සිලිබිල්ලා, නිල් කිතලා, ලතුවැකියා, රත්මල් කිරලා  දැකිය හැක. තවද වඳ වී යන සත්වයින් ලෙස කැබැල්ලෑවන්, හම්බාවන් එල්ලංගාව තුල ජීවත් වේ.

වනාන්තර වලින් ලබා ගන්නා සේවාවන් ලෙස මිනිසුන් දර කඩා ගැනීමට වනය නිතර භාවිතා කෙරේ.මීට අමතරව දිවුල්, පලු, වීර වැනි පලතුරු සොයාගැනීමට මිනිසුන් වනාන්තරය භාවිතා කරයි. සත්ව පාලනයේ යෙදෙන ගොවීන් තණකොල හා අනෙකුත් සතුන්ගේ ආහාර සඳහා සතුන් වනාන්තර වලට මුදා හරී.




වාර්ෂිකව පොතු වැ පිටිය මහ වැව නඩත්තුවක් නොමැති කමින්

එල්ලංගාව තුල හේන් වගාව සහ පොල් වගාව බහුලව දක්නට ලැබෙන අතර වන අලින් සහ මොණරුන්, වල් ඌරන් සහ රිලවුන් බහුලව දක්නට ලැබේ. එල්ලංගාව තුල වගා කරනු ලබන සෑම ඉඩමකටම විදුලි වැටවල් යෙදීම නිසා සතුන්ගේ ගමනාගමනයට බාධා වී ඇති අතර මේ නිසාම අලි මිනිස් ගැටුම උග්‍ර වී ඇත. එසේම සෑම වැවකම වැව් රක්ෂිතය දක්වා වගා කර ඇති අතර මේ නිසා වැව ආරක්ෂාව සඳහා තිබූ ගස් ගොම්මන විනාශ වී ඇත.

එල්ලංගාවේ සිදුවන කෘෂිකාර්මික ක්‍රම බොහෝමයක් දැකගත හැකිය. මෙහිදී හේන් වගාවන් බහුලව සිදු වේ. මෙහිදී සිදු වන වනාන්තර එලි පෙහෙලි කිරීම් එල්ලංගාවේ පැවැත්මට දැඩි තර්ජනයක් වී ඇත.හේන් වගාවන්ට අමතරව පොල් හා අමතර බෝග වගාවන් කිහිපයක් ද නිරීක්ෂණය විය. පොතුවැපිටිය මහ වැව ආසන්නයේ අක්කර 15ක පමණ පොල්වත්තක් දක්නට ලැබේ.හේන් සෑදීම සඳහා යොදා ගෙන අත්හරින ලද ඉඩම් වල ලඳු කැලෑව බහුලව පවතින නිසා වන සතුන්ද මෙම ප්‍රදේශයේ බහුල වශයෙන් වාසය කරයි. මීට අමතරව කොලපොතු වැව හා වරා වැව ආශ්‍රිතව තරමක් උස් කළුගල් තලාවක් දක්නට ලැබෙන අතර ගනේගම රජමහා විහාරය ඒ ආශ්‍රිතව පිහිටා ඇත. ඉහළ ,මැද හා පහළ ගනේගම වැව් වලට අයත් ඉඩම් වලින් බහුතරයක් පන්සල් ඉඩම් වේ.

මෙම වැව් 04 තුල පෝෂක ප්‍රදේශ ලෙස වනාන්තර දක්නට නොලැබේ. අනෙකුත් වැව් වල ජල පෝෂක ප්‍රදේශ වගා කටයුතු සඳහා යොදා ගෙන ඇති බව දක්නට ලැබේ. විශේෂයෙන් වරා වැවට ජල පෝෂක ප්‍රදේශයක් දක්නට නොලැබෙන අතර වැව ඉහත්තාව දක්වාම වැවේ කුඹුරු යාය විහිදී ඇත. සාම්ප්‍රදායික වැවක තිබිය යුතු ගස් ගොම්මන, මඩවල, පෙරනය, වැව් ඉස්මත්ත වැනි කිසිදු ලක්ෂණයක් දක්නට නොමැත.
පොතුවැපිටිය මහ වැවට වම් පැත්තෙන් බඹර ගල වන සංරක්ෂණ අයිති කෙටසක් පිහිටා ඇති අතර ඒ අවට ජන ශූන්‍ය ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැක. වැවට ගමන් කිරීම සඳහා මාර්ගයක් ඇති අතර විශේෂයෙන් වැව ඉහත්තාවට සාමාන්‍ය පරිදි ගමන් කිරීම අපහසු නොවේ. මෙම වැව් 04 ම 1931-1933 යන කාල වල ඉදිකරන ලද වැව් බව පැහැදිලි වේ.


## 3.5 එල්ලංගාව තුළ සිදුවන මානව ජීවනෝපාය ක්‍රියාකාරකම්

පොතුවැපිටිය එල්ලංගාව පිහිටා ඇත්තේ දුර්වල ජල වහනයක් සහිත පහතරට වියලි කලාපය තුල වේ. සාමාන්‍ය ජනගහනයක් පවතින මෙම ප්‍රෙද්ශයේ ජනගහනයෙන් 56%ක් කාන්තා ජනගහනය වේ. මුළු ජනගහනයෙන් 33% වයස අවුරුදු 20ට වඩා අඩු වන අතර සේවා නියුක්ත ජනගහනයෙන් 80% පමණම කෘෂිකර්මාන්ත ආශ්‍රිතව ජීවනෝපාය සලසා ගනී. ඒ අනුව ප්‍රධාන මානව ක්‍රියාකාරකම් ලෙස ගොඩ හා මඩ ගොවිතැන් කිරිම හඳුනාගත හැක. හේන් වගාව සඳහා වනාන්තර එළිකිරීමත් පොල් හා කෙසෙල් වගාව සිදු කිරීමත් දක්නට ලැබෙන අතර මෙම කාලයේ දී ප්‍රෙද්ශය තුල වඳුරු හා රිලව් ගහනය ඉහළයාම හේතුවෙන් බොහෝ ගොවීන් හේන් සහ ගොඩ ගොවිතැනෙන් ඉවත්වන බව ප්‍රද්ශයේ ගොවීන් පෙන්වා දෙයි. ඒ හේතුවෙන් හේන් ගොවිතැන සඳහා එළිකර අතහැරදැමූ වනාන්තර කොටස් ප්‍රෙද්ශයේ බහුලව දක්නට ලැබේ.
මීට අමතරව ස්වයං රැකියාවල නියුක්ත පිරිසක්ද ප්‍රද්ශය පුරා ව්‍යාප්තව ජීවත්වන අතර නිම් ඇඳුම් කර්මාන්තය, පෙදරේරු කර්මාන්තය, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන, වඩු කර්මාන්තය, කළුගල් කැඩීම වැනි කර්මාන්ත ද ජීවනෝපාය ක්‍රම ලෙස භාවිතා කරයි.

## 3.6 එල්ලංගාවේ සමාජ ආර්ථික තොරතුරු

එල්ලංගාව අයත් වන ග්‍රාම නිලධාරී වසමේ පවුල් සංඛ්‍යාව 288ක් වේ. මෙහි සමස්ත ජනගහනය 846ක් වන අතර ඉන් 54% ( 457) ගැහැණු ද 46%(389) පිරිමි ද වේ. මේ අතරින් වයස අවුරුදු 20ට අඩු ජනගහනය 275ක් වන අතර වයස අවුරුදු 20-59 ත් අතර ජනගහනය 423ක් වේ. වයස අවුරුදු 60 හා ඉහළ ජනගහනය 148කි. මෙම ප්‍රදේශයේ සමස්ථ ජනගහනයෙන් 99.9% ක්ම සිංහල බෞද්ධ වේ.


ප්‍රස්තාර අංක 05 - එල්ලංගාවේ ජනගහන ව්‍යාප්තිය වයස් ඛාණ්ඩ අනුව




**මූලාශ්‍රය - 2023 සම්පත් පැතිකඩ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

ඒ අනුව ජනගහනයෙන් 33% කොටසක් වයස අවුරුදු 20ට අඩු වයසේ බව දක්නට ලැබේ. වැඩකරන වයසේ ජනගහනය 50% මට්ටමේ පවති. මෙම ප්‍රදේශයේ ජනතාවගේ අධ්‍යාපන මට්ටම සැලකූ විට ජනගහනයෙන් 3.1%ක් පිරිසක් කිසිදා පාසල් නොගිය ඛාණ්ඩයට අයත්වන අතර අනෙකුත් සියලුදෙනා යම්කිසි අධ්‍යාපනක් තිබේ. ඒ අතරින් 75% පමණ අ.පො.ස. (සා.පෙළ) හා ඊට ඉහළ අධ්‍යාපන මට්ටමක් ලබා තිබේ. ජනගහනයෙන් 48.5% පමණ අ.පො.ස (සා.පෙළ) මට්ටමෙන් පසුව අධ්‍යාපන ක්‍රියාවලියෙන් බැහැර වී ඇත.


ප්‍රස්තාර අංක 06 - ඒල්ලංගාවේ අධ්‍යාපන මට්ටම අනුව




මුලා මූලාශ්‍රය - 2023 සම්පත් පැතිකඩ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

එල්ලංගාව තුල ජීවත් වන ගැමියන් ගේ අධ්‍යාපනය අනුව කිසිදා පාසල් නොගිය කාණ්ඩය ලෙස 27 දෙනකු සිටින අතර ද්විතියික අධ්‍යාපනය ලද අය 291 කි. 6–11 වසර දක්වා අධ්‍යාපනය ලද අය 291 කි, උසස් පෙළ සමත් 97 දෙනෙකි. උපාධිලත් 14 දෙනකි.

ප්‍රස්තාර අංක 07- ඒල්ලංගාවේ අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්තිය





මුලා මූලාශ්‍රය - 2023 සම්පත් පැතිකඩ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ඒල්ලංගාවේ අධ්‍යාපන මට්ටම අනුවසේවා වියුක්තිය ඉහත ප්‍රස්තාරයෙන් මනාව පැහැදිලි වේ.08 ශ්‍රේණිය සමත් ස්ත්‍රී 63 ද පිරිමි 57 දදෙනෙකු සා පෙළ සමත් ස්ත්‍රී 49ක් පිරිමි 39ද විරැකියාවෙන් සිටි. උසස් පෙළ සමත් කාන්තාවන් 29 හා පිරිම 19 රැකියා නොමතිව සිටි.

මේ අතුරින් වැඩකළ හැකි ජනගහනයෙන් 4%ක් සේවා නියුක්ත වන අතර සේවා වියුක්තිය 34% පමණ වේ. ඒ අතරින් සේවා නියුක්ත අංශ පහත පරිදි විහිදී ගොස් ඇත.

ප්‍රස්තාර අංක 07 - එල්ලංගාංවේ රැකියා නියුක්තිය




මූලාශ්‍රය - 2023 සම්පත් පැතිකඩ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ඉහත වගුව අනුව ප්‍රදේශයේ රැකියා නියුක්ත ජනගහනයෙන් වැඩි පිරිසක් කෘෂිකාර්මාන්තය ආශ්‍රිතව තම ජීවනෝපාය සකසා ගන්නා බව පෙනී යයි.

## 3.7 එල්ලංගාවේ පවතින ඉදිකිරීම්

එල්ලංගාව තුළ වැව් 06 කි. මේ අතුරෙන් වැව් 4 ක් දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය කිරිමට ඇති අතර සුළු අලුත් වැඩියාවන් කිහිපයක් පමණක් සිදු කිරීමට නියමිත වන බැවින් ඒවා මේ වන තෙක්ගොවි සංවිධාන වලට භාරදී නොමැත. එල්ලංගාව තුළ අලි මිනිස් ගැටුම ඉතා බරපතලය. මේ සඳහා විසඳුමක් වශයෙන් අලි වැට ඉදිකර ගැනීමට ප්‍රජාව උත්සාහ දරයි. බොහෝ වගා බිම්වල උඩ පැලක් හා අලි වැටක් ඉදිකර ඇත.

ප්‍රදේශයේ ජනතාවගේ නිවාස සහ කුඩා ව්‍යාපාර ස්ථාන වලට අමතරව එල්ලංගාව තුල දක්නට ලැබෙන විශේෂ ඉදිකිරිම් ලෙස නියදවනය කණිෂ්ඨ විද්‍යාලය පොතුවැපිටිය සමෘද්ධි බැංකැව, පොතුවැපිටිය ප්‍රජා ශාලාව, පොතුවැපිටිය, ගනේගම රජමහා විහාරය ආදී පොදු ස්ථාන හඳුනාගත හැක.

ප්‍රෙද්ශයේ පානීය ජල අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා ඉදිකළ නියදවනය රන්දිය දහරප්‍රජාමූල ජල යෝජනා ක්‍රමය හා ගොවිතැන සඳහා අවශ්‍ය ජලය සපයා ගැනීමට කෘෂි ලිං 12ක් ද දක්නට ලැබේ.

## 3.8. එල්ලංගාවේ කෘෂිකාර්මික බෝග වගා රටාව

ප්‍රදේශයේ කෘෂිකාර්මික රටාව ලෙස මහ කන්නය වැසි ජලය උපයෝගී කරගෙනද යල කන්න වැව් හා කෘෂි ළිංවල ජලය කළමනාකරනය කරමින් ද සිදු කරන අතර යල කන්නයේ වී වගාව බහුලව සිදු කරන අතර හේන් වගාවද සිදු කරයි. නමුත් යල කන්නයේ දී සමහර වැව් ආශ්‍රිතව යල බෙද්ම ක්‍රමයට වගා කටයුතු සිදු කරන අතර බොහෝ විට අතිරේක බෝග වගාව සිදු කරයි.

එල්ලංගාවට අයත් මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර 35.23ක් ගොඩ හා මඩ ඉඩම් ලෙස වගා කටයුතු කරනු ලබයි. මෙයින් මහ කන්නයේ දී හෙක්ටයාර 11.75ක් හා යල කන්නයේ දී හෙක්ටයාර 4.86ක් ලෙස මඩ ඉඩම් වගා කරන අතර එයින් මහ කන්නයේ දී වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 79ක් ද යල කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 32ක් ද වේ. දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් වැව් ප්‍රතිසංස්කරණයෙන් අනතුරුව මෙම නිෂ්පාදනය මහ කන්නයේ දී මෙට්‍රික් ටොන් 95ක් ද යල කන්නයේ දී මෙට්‍රික් ටොන් 58ක් ද ලෙස ඉහළ නැංවීමට බලාපොරොත්තු වේ.

අතිරේක බෝග ලෙස ඩබ ඉරිඟු, රට කජු, ලොකු ළූණු, මුං ආදියද පළතුරු ලෙස කෙසෙල්, පැණි කොමඩු අදිය ද ඊට අමතරව පොල් වගාව ද ප්‍රෙද්ශය පුරා දක්නටලැබේ. පොතුවැපිටිය එල්ලංගාව යටතේ බඩ ඉරිඟු නිෂ්පාදිත බිම් යල සහ මහ ලෙස පිලිවෙළින් හෙක්ටයාර 7 සහ 6 ලෙසද බඩ ඉරිඟු නිෂ්පාදනය මහ සහ යල පිළිවෙලින් මෙට්‍රික් ටොන් 22 හා 18 ලෙසද හඳුනා ගැනේ. මීට අමතරව යල කන්නයේ දී රටකජු වගා කරන අතර එය හෙක්ටයාර 9ක් තුල මෙට්‍රික් ටොන් 15 ක් වේ පැනි කොමඩු නිෂ්පාදනය ද සැලකිය යුතු මට්ටමකින් සිදු කරන අතර හෙක්ටයාර 4කින් මෙට්‍රික් ටොන් 23ක් නිෂ්පාදනය කරනු ලබයි. මීට අමතරව අක්කර 20කට වඩා වැඩි ප්‍රදේශයක පොල් වගාවද දක්නට ලැබේ. විශේෂයෙන් මැද ගනේගම වැව ආශ්‍රිතව අක්කර 15ක පමණ විශාල පොල් වගාවක් දක්නට ලැබේ.



පොතුවැ පිටිය මහ වැව ඉස්මත්තේ පොල් වගාවක්

දේශගුණ සුහුරු ව්‍යාපෘතිය මගින් මෙම ප්‍රෙද්ශ වල අතිරේක බෝග වගාව සඳහා රටකජු හා තල බෝග පෙදා හැර ඇත.

## 3.9එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණය

පහත රට වියළි කලාපයට අයත් මෙම එල්ලංගාවේ මහ කන්නය සඳහා හොඳින් ජලය ලැබෙන අතර යල කන්නයේ දී වැව් වල පවතින ජලය මනා කළමනාකරණයකින් යුක්තව බෙදා ගැනීම තුලින් වගා කටයුතු සඳහා යොදා ගනී. බොහෝවිට මහ කන්නයේ දී ලැබෙන වර්ෂාව හේතුවෙන් වැව් ආශ්‍රිත සියලු ගොඩ මඩ ඉඩම් වගා කලද යල කන්නයේ දී යල බෙත්ම ක්‍රමය යටතේ වගා කටයුතු සිදු කරයි. කොස් කොට ගොල්ල වැව,මී ගහ මුල්ල වැව, ඉහල වැව, ගෙදරගාව වැව, පච්චගොල්ල.සියඹලාගහමුල වැව, වෙදා ගේ වැව සුමංගල වැව යන වැවැ වලින් ජලඅවශ්‍යතා කළමනාකරණය සිදු කරනු ලබයි.

ඊට අමතරව ගොඩ භෝග වගාවට සහ යල කන්නයේ දී සිදුකරන අතිරේක භෝග වගාවන්ට උපයෝගී කර




ගැනීම සඳහා ප්‍රදේශය පුරා කෘෂි ළිං 21ක් පමණ ඉදිකර ඇත. විශේෂයෙන් යල කන්නයේදී ඉහත සඳහන් වැව් වල ජලය කෘෂි අවශ්‍යතා සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බවත් එම ජල අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීමට ඊට ආසන්නයේ පිහිටා ඇති කෘෂි ළිං වලින් ජලය මෝටර් යොදා පොම්ප කරන බවත් සමීක්ෂණයේ දී ප්‍රදේශය වාසීන් පෙන්වා දෙන ලදි.

ගොවි සංවිධානයේ ක්‍රියාකාරී තත්වය හා නීති රීති ද නඩත්තුව දුර්වල වීමට හේතුවේ. මෙම පද්ධතිය තුල පවතින ගොවි සංවිධානයේ තනතරු බෙදීයාමේදී පවතින විශමතාවය මෙයට බලපා ඇත. තවද මෙයට එල්ලංගාවේ පවතින තත්වය සෘජුවම බලපාන ලබයි. තවද රක්ෂිත හා අනවසර ගොවීන් මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා සහභාගී නොවේ(එල්ලංගාව මුලුමනින්ම ප්‍රජාව පදිංචිව සිටින ගම්මාන වලින් යුක්තය. ගෙවතු ගොඩ ඉඩම් හා විවිධ ස්ථිර බෝග වගාවන්ගෙන් ව්‍යාප්ත වී ඇති බොහොමයක් වැව් වල කුඹුරු සීමාව අවසන් වන්නේ පහලින් පිහිටා ඇති වැවේ තාවුල්ලෙනි. මෙම වැව් තාවුල්ල හා බැදුනු එල්ලංගා පද්ධතියේ ආරක්ෂාවට පැවති අංගෝපංග නැත.) ජල පාලක වරුන් සෑම වසරකම අලුතෙන් පත් කරන්නේ කන්න රැස්වීමේ දීය. ඇතැම් ජලපාලකයන් එක දිගට ම වසර ගණනාවක් කටයුතු කරන බව පෙනේ. ගොවිසංවිදන රැස්වීම් වල සනපුරණය පිළිබඳව බරපතල ගැටලු පවතී . පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුව ගොවි සංවිධානය මගින් සිදු කරනු ලබන බව වාර්තා වුවත් ගොවීන්ගේ අදහස් ඊට පටහැනියෙ. නඩත්තුව ගොවීන් වෙත පංගු ලැස්තුවට අනුව බෙදා ඇත. මෙම මෙහෙයුම් හා නඩත්තු කටයුතු වල නිරතවීම වෙනුවෙන් ජල පාලකක වෙත සලාරිස් හෝ ලැබිය යුතු වුවත් එවැන්නක් ක්‍රියාත්මක නොවේ. මෙය අදාල කාර්යය පිළිබඳව වගකීමක් නොගැනීමට හේතුවේ . වර්ෂාව ලැබීම අනුව මහ කන්නයේ වගාව ආරම්බ වන අතර ජලය ඉතිරි වුවහොත් පමණක් යල කන්නයේ වී වගා කෙරේ. ඇතැම් වැව් හා කන්න වල බෙත්ම වගා කෙරේ. මෙය වගා ක්‍රමය ගොවීන් වගා කටයුතු පිළිබඳව දුර්වල කරන්නාවූ ක්‍රමයකි. වී වගා නොකරන ඉඩම් වල මුං වගාව හෝ වෙනත් ආහාර බෝග වගාවක් සිදු කරනු නොලබයි. මේ හේතුවෙන් මෙහෙයුම් හා නඩත්තුව සම්බන්ධයෙන් ගොවි සහබාගිත්වයේ විශේෂ දුර්වල බවක් පෙන්වයි. තවද මෙහෙයුම් හා නඩත්තුව පිළිබඳව සැලසුමක් හෝ අරමුදලක් පවත්වාගෙන යන බවක්

නොපෙනේ. තවද ගොවි සංවිධාන වසර 35 කට වැඩි ඉතිහාසයක් පැවතියද  අරමුදල් වර්ධනය වීමක් නැත.සංවිධාන වල ඇත්තේ ඉතා සුළු අරමුදලකි. මෙය පද්ධතියේ මෙහෙයුම හා නඩත්තුවට පවතින ප්‍රබල බලපෑමකි. තවද කන්න රැස්වීම හා පංගු ලැයිස්තු අනුව එම තීන්දු තීරණ පැහැර හරින ගොවීන්ට විරුද්දව නීතිමය පියවර නොගැනීමත්  මෙහිදී සැලකිල්ලට  ගත යුතුය. නිලධාරීන්ගේ හිගකම හෝ නොසැලකිල්ලද මෙයට හේතුවේ. වාරිමාර්ග කළමනාකරණය හා නඩත්තු සැලැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිලිබඳව  ගොවි සංවිදානයට පුහුණුවක් ලබාදිය යුතුවේ.

.




## 4 පොතුවැපිටිය එල්ලංගාව මුහුණදෙන මූලික අභියෝග හදුනා ගැනීම

එල්ලංගාව මුහුණදෙන ප්‍රධාන අභියෝග

පොතුවැපිටිය එල්ලංගාව සම්බන්ධයෙන් සිදුකල හරස්කඩ චාරිකා මගින් හා එල්ලංගා කළමනාකරණ කමිටු මගින් හඳුනාගත් එල්ලංගාවට සම්බන්ධ ගැටළු පහත පරිදි වේ.

01. සාම්ප්‍රදායික වාරි පරිසර පද්ධතියක තිබිය යුතු මූලික අංග සම්බන්යෙන් ගැටළු ඇතිවීම.

1.1.කට්ට කඩුව නොමැතිවීම හා කට්ට කඩුවේ ගස් නොමැතිවීම

1.2.පෙරහන ( උස්වැටිය ) නොමැති වීම

1.3.පිටවාන හා වාන් ඇළ සම්බන්ධ ගැටළු

1.4.සොරොව්ව සම්බන්ධ ගැටළු

1.5. ඇළවේලි විධිමත් නොවීම

1.6.ගොඩවල නොමැති වීම

1.7.වැව් බැම්ම සම්බන්ධ ගැටළු

1.8.කුණු ඇළ නොමැති වීම

02. ආක්‍රමණික ජලජ ශාක පැතිරීම

03. පාංශු ඛාදනය හේතුවෙන් වැව්වල රොන්මඩ තැන්පත් වී වැව් ගොඩවීම

04. ජල පෝෂක ප්‍රදේශයේ වගා කිරීම හේතවෙන් ජල පෝෂක ප්‍රදේශය සීමා වීම

05. නඩත්තු කටයුතු ක්‍රමවත්ව සිදු නොකිරීම

06. වන සතුන්ගෙන් සිදුවන හානි

ගොවි සංවිධාන වලින් අපේක්ෂිත කාර්යයන් අපේක්ෂිත මට්ටමින් සිදු නොවී

## 4.1. පොතුවැපිටිය එල්ලංගා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරණ ක්‍රියාත්මක සැලැස්මේ සංෂිප්ත වාර්තාව

උග්‍ර ගැටළු විසඳීම/අවම කිරීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීම් පොතුවැපිටිය එල්ලංගාව

වගු අංක 11-

| අනු අංක | උග්‍ර ගැටළු | යෝජිත උපාය මාර්ගික සැලැස්ම | මැදිහත්විය යුතු ආයතන |
|---|---|---|---|
| 1 | ගොඩවල වැසී යාම නිසා වැව ගොඩවීම . (පොතුකොල වැව/පොතුවපිටියමහ වැව/වරාවැව /පුලන්විය /පහල වැව / මීගහකුම්බුරවව) | I. CMC හිදී සාකච්ජා කිරීම<br>II. ස්තානීය පරීක්ෂාව.<br>III. අනවසර කරුවන් හදුනගැනීම<br>IV. ඇස්තමේන්තු කිරීම<br>V. ගොඩ වල නඩත්තු කිරීම | I. CMC<br>II. ප්‍රා ලේකම්<br>III. ගොවි සංවිධාන<br>IV. ගොවිජනසං දෙ<br>V. පොලීසිය<br>VI. මිනින්දෝරු දෙ |
| 2 | කට්ටකඩුව හා පෙරණය නැත.<br><br>(පොතු කොල වැව /පොතුවපිටිය මහවැව/වරා වැව /පුලන්විය වැව / පහල වැව /මීගහකුඹුර වැව ) | I. CMC හිදී සාකච්ජා කිරීම<br>II. අදාල වැව් හදුනා ගැනීම<br>III. ගොවි සංවිධාන හා අදාල ගොවීන් දැනුවත් කිරීම<br>IV. කට්ට කඩුව ඒකාබද්ධ නිරීක්ෂණයකින් වෙන් කිරීම<br>V. සුදුසු වෘක්ෂලතා ආවරණයක් යෙදීම | 1 ගොවි සංවිධාන<br>2 CSIAP/(CMC)<br>3 ගොවි පජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |
| 3 | ආක්‍රමණශීලී ජලජ ශාඛ වලින් වැව වැසී පැවතීම<br>පොටුකොලවවපොතුවැපිටිය | I. CMC හිදී සාකච්ජා කිරීම හා වැව් හදුනාගැනීම.<br>II. ඇස්තමේන්තු කිරීම.<br>III. සුදුසු කෘමිනාශක යෙදීමට ගොවි සන්විදනයට පැවරීම. | 1 ගොවි සංවිධාන<br>2 CSIAP/(CMC)<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ<br>5 ප : කෘෂි : දෙ : |
| 4 | වාන් ඇල ගොඩවීම<br><br>පොතුකොලවැව/පොතුවපිටියමහවැව/වරා වැව /පුලන්විය/පහල වැව/පහල වැව /මීගහකුම්බුර වැව | I. CMC හිදී සාකච්ජා කිරීම<br>II. තාක්ෂණ උපදෙස් ලබාගෙන ඇස්තමේන්ත සකස් කිරීම .<br>III. ප්‍රතිපාදන සපයා ගැනී ව්‍යාපෘතිය මගින් ඉටු කිරීම | 1 (CMC)<br>2 CSIAP<br>3 ගොවි සංවිධාන /SAC<br>4 ගොවිජන සං දෙ<br>5 පළාත් වාරිමාර්ග දෙ |

| | | | |
|---|---|---|---|
| 5 | සොරොව්වෙන් ජලය කාන්දුවීම<br>පොතුකොල වැව<br>වරා වැව<br>පොතුවපිටිය මහවැව | I. CMC හිදී සාකච්ජා කිරීම<br>II. තාක්ෂණ උපදෙස් ලබාගෙන ඇස්තමේන්ත සකස් කිරීම .<br>III. ප්‍රතිපාදන සපයා ගැනීම<br>IV. ව්‍යාපෘතිය මගින් ඉටු කිරීම | 1 (CMC)<br>2 CSIAP<br>3ගොවිසංවිධාන/SAC<br>4 ගොවිජන සං දෙ<br>5 පළාත් වාරිමාර්ග දෙ |
| 6 | වානෙන් ජලය කාන්දුවීම නිසා වගා කිරීමට ජලය මදි.<br>පොතුවපිටිය මහවැව | I. CMC හිදී සාකච්ජා කිරීම<br>II. ස්ථාන හදුනාගැනීම<br>III.ඇස්තමේන්තු කිරීම<br>IV.තාක්ෂණික උපදෙස් ලබා ගැනීම<br>V.ප්‍රතිපාදන සපයා ගැනීම .හාගොවි සංවිධානය මගින් කෘෂි පාර ඉදි කිරීම . | 1 ගොවි සංවිධාන<br>2 CSIAP /CMC)<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග |
| 7 | වැව් බැම්මේ හුඹස් බැදී ඇත<br>නඩත්තුව දුර්වලය<br><br>පොතුකොල වැව | I.CMC හිදී සාකච්ජා කිරීම<br>II.ස්ථාන හදුනාගැනීම<br>III.තාක්ෂණික උපදෙස් ලබා ගැනීම හා ඇස්තමේන්තු කිරීම<br>IV.ගොවි සංවිධානය මගින් ගොඩවල සුද්දකිරීම . | 1 ගොවි සංවිධාන<br>2 CSIAP/(CMC)<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |
| 8 | බෙදුම් ඇල නැත<br>පොතුකොල වැව<br>වරා වැව<br>පොතුවපිටිය මහවැව | I. එල්ලංගා කළමනාකරණ කමිටුව සමග සාකච්චා කිරීම<br>II. නඩත්ත සැලැස්මක් සකස් කිරීම<br>III. ගොවීන් දැනුවත් කිරීම හා ක්‍රියාත්මක කිරීම | 1 ගොවි සංවිධාන<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 CMC |

| | | | |
|---|---|---|---|
| 9 | වාන් ඇල බැම්ම උතුරා යාම නිසා වගාවන් හානිවීම.<br>පොතුකොල වැව<br>වරා වැව<br>පොතුවපිටිය වැව | I.CMC හිදී සාකච්ඡා කිරීම<br>II.ස්ථාන හඳුනාගැනීම<br>IIIතාක්ෂණික උපදෙස් මත ඇස්තමේන්තු කිරීම<br>IVගොවි සංවිධානය මගින් අවශ්‍ය ඉදිකිරීම් කිරීම. | 1ගොවි සංවිධාන<br>2 CMC<br>3ගොවිජන සං දෙ<br>4 ප්‍රා .ලේ. කාර්යාලය. |
| 10 | මිරිදිය මත්ස්‍ය සම්පත නැත<br>පොතුවපිටිය මහවැව | I.CMC හිදී සාකච්ඡා කිරීම<br>II. වැව් හඳුනාගැනීම<br>III. ඇස්තමේන්තු කිරීම<br>IV.නැක්ඩා මගින් මසුන් මුදාහැරීම. | 1 ගොවි සංවිධාන<br>2 ගොවිජන සං දෙ<br>3ප්‍රා.ලේ.කාර්යාලය. |
| 11 | කිඹුල් ගහනය නිසා ජීවිත අවදානම<br><br>පොතුකොල වැව<br>වරා වැව<br>පොතුවපිටිය මහවැව | I. CMC හිදී සාකච්ඡා කිරීම.<br>II.ස්ථාන හඳුනාගැනීම<br>III.ඇල වේල්ල අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු කිරීම<br>IV.ගොවි සංවිධානය මගින් ඉටු කිරීම. | 1 ගොවි සංවිධාන (CMC)<br>2 CSIAP<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් වාරිමාර්ග දෙ |
| 12 | පාංශු ඛාදනය නිසා වැව් ගොඩවීම<br>පොතුකොල වැව | I. CMC හිදී සාකච්ඡා කිරීම.<br>II. ස්ථාන හඳුනාගැනීම<br>III. ඇස්තමේන්තු කිරීම<br>IV. ගොවි සංවිධානය මගින් පාංශු ඛාදන වැටි දැමීම | 1 ගොවි සංවිධාන<br>2 CSIAP/(CMC)<br>3 ගොවිජන සං දෙ<br>4 පළාත් කෘෂි දෙ |
| 13 | කෘෂි පාර කැඩී ඇත ප්‍රවාහනය අපහසුය.<br><br>( පොතුවපිටිය මහවැව යය කෘෂි පාර / පහළ වැව / අස්වෙද්දුම කුඹුරු පාර ) | I. CMC හිදී සාකච්ඡා කිරීම.<br>II. ස්ථාන හඳුනාගැනීම<br>III. ඇස්තමේන්තු කිරීම<br>IV. ගොවි සංවිධානය මගින් ගොඩවල සුද්ද කිරීම. | 1 ගොවි සංවිධාන<br>2 CSIAP/(CMC)<br>3 ප්‍රාදේශීය සභාව |

## 4.2. පොතුවැපිටිය හරස්කඩ චාරිකාවෙන් හඳුනාගත් ප්‍රමුඛතාගත කල ගැටලු හා යෝජිත උපාය මාර්ග හා සැලැස්ම

වගු අංක 07 –

එල්ලංගාකලමණාකරන කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිත උග්‍ර ගැටළු විසඳා ගැනීම හෝ අවම කිරීම සඳහා යෝජිත ප්‍රධාන ක්‍රියාත්මක සැලැස්ම හා දළ ඇස්තමේන්තුව

| අනු අංක | දළ ඇස්තමේන්තුගත වියදම / සහ යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම්පොතුවපිටිය එල්ලංගාව | ආසනන වියදම් (රු.) | 2024/2025 | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඔ/ නො | දෙ/ජ න | මා/ අප්‍රි | මැ/ ජ | ජ/අ | සැ/ ඔ | නෙ/ දෙ | | |
| 1 | ගොඩවල වැසී යාම නිසා වැව ගොඩ වීම (ගොඩවල ප්‍රතිසංස්කරණය කිරීම) | 0.3 | | | ■ | ■ | ■ | | | | |
| 2 | කට්ට කඩුව හා පෙරණය නැත. (කට්ට කඩුව ප්‍රතිශ්ඨාපනය කිරීම හා පෙරහන දැමීම) | 0.2 | | ■ | ■ | ■ | | | | | |
| 3 | ආක්‍රමණ ශීලී ජලජ ශාඛ වලින් වැව වැසී පැවතීම (සුදුසු කෘමිනාශකයක් යෙදීම ) | 0.2 | | | ■ | ■ | ■ | | | | |
| 4 | වාන් ඇල ගොඩවීම (වාන් ඇල ප්‍රතිසංස්කරණය කිරීම) | 0.4 | ■ | ■ | ■ | | | | | | |
| 5 | සොරොව්වෙන් ජලය කාන්දුවීම (ප්‍රතිසංස්කරණය කිරීම) | 0.3 | | ■ | ■ | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 6 | වානෙන් ජලය කාන්දුවීම නිසා වගා කිරීමට  ජලය මදි . | 0.2 | | | | | | | | | |
| 7 | වැව් බැම්මේ හුඹස් බැදී ඇත වාරිමාර්ග පද්ධතිය නඩත්ත ඉතා දුර්වලයි | 0.2 | | | | | | | | | |
| 8 | බෙදුම් ඇල  නැත. | 1.5 | | | | | | | | | |
| 9 | වාන් ඇල බැම්ම උතුරා යාම නිසා වගාවන් හානිවීම. | 0.4 | | | | | | | | | |
| 10 | මිරිදිය මත්ස්‍ය සම්පත නැත | 0.2 | | | | | | | | | |
| 11 | කිඹුල් ගහනය නිසා ජීවිත අවදානම | 0.1 | | | | | | | | | |
| 12 | පාංශු ඛාදනය නිසා වැව් ගොඩවීම | 0.3 | | | | | | | | | |
| 13 | කෘෂි පාර කැඩී ඇත ප්‍රවාහනය අපහසුය | 0.8 | | | | | | | | | |
| | එකතුව | 5.2 | | | | | | | | | |

# 5 ඇමුණුම්

ඇමුණුම් අංක 01

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

கமநல அபிவிருத்தித் திணைக்களம்

DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | 7/3/9/CMC/2023 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2023.08. 03 |

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>

**<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>**

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාවත් (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල් මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

i. එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ මිරිදිය ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම්, වන සම්පත හා වන ජීවී අවශ්‍යතා තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් විධිමත් ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, த. பெ. 537, கொழும்பு 07.

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා ඉහළ දෙනතුන් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

## 3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

## 3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායී ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායීතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

**xxvii.** වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරි හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරි හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරී
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරි හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම් නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

*සැ:යු :- එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.*

**3.5. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම**

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

**3.6. එල්ලංගා පද්ධති කළමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම**

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටුවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)

ඇමුණුම් අංක 02

හරස්කඩ චාරිකාව සඳහා සහභාගී වූ හවුල්කාර ආයතන වල ලේඛණය

1. පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
2. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
3. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
4. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
5. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
6. ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය
7. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව -කුරුණෑගල
8. දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය
9. ගොවි සංවිධානය-වරාගම්මන
10. ගොවි සංවිධානය - බොර වැව

වනාන්තරයේ පිහිටි වැව් සංඛ්‍යාව නැත මෙම එල්ලංගාවට අයත් වැව් 06ම ජනාවාස ආසන්නයේම පිහිටා ඇත. මෙම වැව් 1931 -1933 වර්ෂ වල දි ඉදිකර ඇති බව ගම්මුන් ගේ අදහසයි. අක්කර 195ක කුඹුරු ප්‍රමාණයක් වගා කරනු ලබයි. මේ යටතේ ගොවි පවුල් 141ක් පමණ යැපීම් කටයුතු සිදු කරයි.

එල්ලංගාවට අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 562.96

එල්ලංගාවට අයත් භූමි ප්‍රමාණය අක්කර 26

එල්ලංගාවෙන් පෝෂිත කෘෂි බිම් -මඩ ඉඩම් අක්කර 370

ගොඩ ඉඩම් 392 වී වගාව මහ කන්නය - අක්කර 77

යල කන්නය - අක්කර 37

අතිරේක බෝග - බඩ ඉරිඟු, රටකජු, එළුණු, මුං

පලතුරු - පැණි කොමඩු, කෙසෙල්

වානිජ බෝග - පොල්

පෝෂක ප්‍රදේශයේ පදිංචි පවුල් සංඛ්‍යාව - 141